සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதர (சாதாரண தரம்) உதவித் மதிப்பீடு, 2026
Genaeral Certificate of Education (Ord. Level) Supportive Assesment, 2026

ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II முயற்சியாண்மை கற்கை I, II Entrepreneurship Studies I, II	63	S	I,II

පැය තුනයි
மூன்று மணி நேரம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ව්‍යවසායකත්ව අධ්‍යයනය I

උපදෙස් :

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .
* 1 සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ව්‍යවසායකයා යන්න වඩාත් නිවැරදි ලෙස විස්තර කෙරෙන ප්‍රකාශ වන්නේ,
   A - ඔහු අදහස් ක්‍රියාකාරීත්වයට පරිවර්තනය කරයි.
   B - ඕනෑම අවදානමක් ඕනෑම අවස්ථාවක දරා ගනියි.
   C - පරිසර වෙනස්වීම් නොසලකා ස්වාධීනව කටයුතු කරයි.
   D - ව්‍යාපාර අදහසක් සංවර්ධනයට අවශ්‍ය සම්පත් සපයයි.
   (1) B හා D පමණි. (2) A හා D පමණි.
   (3) B හා C පමණි. (4) A හා C පමණි.

2. නිෂ්පාදනය සඳහා අවශ්‍ය කෙරෙන මිනිසා විසින් නිපදවා ඇති සියලු සම්පත් අයත් වන්නේ,
   (1) භූමියට ය. (2) ශ්‍රමයට ය.
   (3) ප්‍රාග්ධනයට ය. (4) ගොඩනැගිලිවලට ය.

3. සෑම ව්‍යවසායකයෙකුම අනාගතයේදී සැබෑ කර ගැනීමට වෙර දරන සිහිනයක් ඇත. එය හැඳින්වෙන්නේ,
   (1) අනාගත දැක්ම ලෙස ය. (2) නිර්මාණශීලීත්වය ලෙස ය.
   (3) සුභවාදී වීම ලෙස ය. (4) නම්‍යශීලීත්වය ලෙස ය.

4. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධකයක් ලෙස සැලකිය හැක්කේ,
   (1) තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම ය.
   (2) රීති හා සම්ප්‍රදාය අවබෝධයෙන් පිළිපැදීම ය.
   (3) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා නොකිරීම ය.
   (4) යම් යම් විශ්වාස කෙරේ තදබල ලෙස ඇලී නොසිටීම ය.

5. සංජීව නිතරම තමා නියැලෙන ඕනෑම ව්‍යාපාරික කටයුත්තකදී ඔහු විසින් යොදවන මුදලට ඇති අවදානම පිළිබඳ සැලකිල්ලක් දක්වයි. අවදානම හා ප්‍රතිලාභය අතර ඇති සම්බන්ධතාව වන්නේ,
   (1) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ.
   (2) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය පහළ වේ.
   (3) අවදානම හා ප්‍රතිලාභය සමාන වේ.
   (4) අවදානම පහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ.

6. සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මකව විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයන් හඳුන්වනු ලබන්නේ,
   (1) ව්‍යාපාර ව්‍යවසායකයන් ලෙස ය. (2) අභ්‍යන්තර ව්‍යවසායකයන් ලෙස ය.
   (3) ආයතනික ව්‍යවසායකයන් ලෙස ය. (4) සමාජයීය ව්‍යවසායකයන් ලෙස ය.

[දෙවැනි පිටුව බලන්න.]

Past Papers Wiki

7. අවශ්‍යතාවල හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
   (1) රාශියක් තිබීම ය. (2) විවිධ වීම ය.
   (3) සීමිත වීම ය. (4) ව්‍යාපාරිකයා නිර්මාණය කිරීම ය.

8. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට සමාජයීය සුභසාධනයට දායක විය හැකි ආකාරයක් වන්නේ,
   (1) නිදහස හා තෘප්තියකට පත්වීමට හැකිවීම ය.
   (2) රැකියා අවස්ථා ලබාදීම ය.
   (3) නව නිෂ්පාදන ලබාදීම ය.
   (4) විදේශ විනිමය උපයාදීම ය.

9. ව්‍යාපාරයේ ප්‍රමාණය අනුව ව්‍යාපාර වර්ග කර දක්වා ඇති නිවැරදි ආකාරය වන්නේ,
   (1) කුඩා පරිමාණ ව්‍යාපාර, මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර
   (2) කුඩා පරිමාණ ව්‍යාපාර, වරලත් ව්‍යාපාර, රාජ්‍ය සමාගම්
   (3) තනි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්
   (4) තනි ව්‍යාපාර, වරලත් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්

10. වෙළෙඳපොළ හිඳැස යනු,
   (1) අලෙවි කරන භාණ්ඩයේ යම් අඩුපාඩුවක් පැවතීම ය.
   (2) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට නොහැකි වූ වෙළෙඳපොළ කොටසයි.
   (3) වෙළෙඳපොළෙහි භාණ්ඩ විකිණීම සඳහා යම්කිසි ස්ථානයක් පැවතීමයි.
   (4) ව්‍යවසායකත්ව කුසලතා හා සැඟව ඇති ශක්ති ප්‍රායෝගිකව භාවිතා කිරීමට හැකිවීම යි.

11. කුඩා පරිමාණ ව්‍යාපාර මඟින් රටක පුද්ගලයන් අතර ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපාන හේතුවක් වන්නේ,
   (1) මහා පරිමාණ ව්‍යාපාර සඳහා භාණ්ඩ හා සේවා සැපයීම ය.
   (2) දේශීය දැනුම හා සම්පත් පමණක් භාවිතා කිරීමය.
   (3) රට පුරා ව්‍යාප්ත වීම තුල රැකියා අවස්ථා බිහි වී සේවා නියුක්තිය වැඩි වීම ය.
   (4) කාලයාගේ ඇවෑමෙන් ඒවා මහා පරිමාණ ව්‍යාපාර බවට පත්වීම ය.

12. ව්‍යවසායකයෙකු නායකයාගේ භූමිකාව තුල සිදු කරනු ලබන කාර්යයක් වන්නේ,
   (1) ව්‍යාපාර සැලසුම් සකස් කිරීම ය.
   (2) ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් සැපයීම ය.
   (3) සේවකයන් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ය.
   (4) ලාභ පාඩු විඳ දරා ගැනීම ය.

13. "ව්‍යාපාරික තරඟකාරීත්වයට මුහුණු දීම" යන්න අයත් වන ව්‍යවසායකත්ව කුසලතාවය වන්නේ,
   (1) මානව කුසලතාවය යි. (2) තාක්ෂණික කුසලතාවය යි.
   (3) උපදේශන කුසලතාවය යි. (4) සංකල්පනාත්මක කුසලතාවය යි.

14. ව්‍යාපාර පරිසරය යන්න වඩාත් හොඳින් ප්‍රකාශ වනුයේ,
   (1) ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට අභ්‍යන්තරයෙන් හා බාහිරින් ඇතිවන බලවේග සියල්ල ය.
   (2) ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට අභ්‍යන්තරයෙන්, ධනාත්මකව හා ඍණාත්මකව ඇතිවන බලවේග සියල්ල ය.
   (3) ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට බාහිරින්, ධනාත්මකව හා ඍණාත්මකව ඇතිවන බලවේග සියල්ල ය.
   (4) ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට අභ්‍යන්තරයෙන් හා බාහිරින්,ධනාත්මකව හා ඍණාත්මකව ඇතිවන බලවේග සියල්ලය.

15. ව්‍යාපාර ආයතනයේ කටයුතුවලට බලපෑම් කරනු ලබන ව්‍යාපාරය තුළ ඇති ප්‍රධාන සාධක වනුයේ,
   (1) අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, සේවකයන් හා සම්පත් ය.
   (2) කළමනාකරුවන්, අයිතිකරුවන්, සේවකයන් හා සම්පත් ය.
   (3) අයිතිකරුවන්, සේවකයන්, සැපයුම්කරුවන් හා සම්පත් ය.
   (4) සේවකයන්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් හා සම්පත් ය.

16. දක්ෂ,නිර්මාණශීලි, විශ්වාසදායක හා කැපවීමෙන් වැඩ කරන කළමනාකරුවන් ආයතනයකට නොමැතිවීම සැලකිය හැක්කේ,
   (1) ශක්තියක් ලෙස ය. (2) දුර්වලතාවයක් ලෙස ය.
   (3) තර්ජනයක් ලෙස ය. (4) අවස්ථාවක් ලෙස ය.

17. අන්තර්ජාතික ගිවිසුම්, විදේශීය වෙළෙඳාම, රාජ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති යන විචල්‍යයන් අයත්වන බාහිර පරිසරය වනුයේ,
   (1) ආර්ථික පරිසරයට ය.
   (2) දේශපාලන හා නෛතික පරිසරයට ය.
   (3) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරයට ය.
   (4) ගෝලීය පරිසරයට ය.

18. පවන් සපත්තු නිෂ්පාදන ව්‍යාපාරයක හිමිකරුවෙකි. ඔහුගේ ව්‍යාපාරය අයත් වනුයේ,
   (1) ප්‍රාථමික අංශයට ය. (2) ද්විතීයික අංශයට ය.
   (3) තෘතීයික අංශයට ය. (4) සේවා අංශයට ය.

19. ගහන විසින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කර ඇති අතර, එහිදී ඔහු ගත යුතු ප්‍රධාන තීරණය වන්නේ,
    (1) සේවකයන් සොයා ගැනීමට හැකි ද යන්න ය.
    (2) නෛතික අවශ්‍යතා ඉටු කළහැකි ද යන්න ය.
    (3) ව්‍යාපාරය සඳහා කොතරම් කැපවිය හැකිද යන්න ය.
    (4) අමුද්‍රව්‍ය සපයා ගැනීමේ හැකියාව ඇතිද යන්න ය.

20. ව්‍යාපාරය පිහිටුවන ස්ථානය කෙබඳුද යන්න ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ගතයුතු වැදගත් තීරණයක් වන අතර ඊට අදාළ සාධකයක් **නොවන්නේ,**
    (1) ගනුදෙනුකරුවන් ප්‍රමාණය සහ ඔවුන්ගේ විසිරීම ය.
    (2) අන්තර් ජාතිකව විසිරී සිටින ශ්‍රී ලාංකික පාරිභෝගික කොටස් ය.
    (3) අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව ය.
    (4) පාරිභෝගිකයන්ට සැපයිය හැකි පහසුකම් ය.

21. වර්තමානයේ ක්‍රියාත්මක වන මෙට්‍රෝ බස් (METRO BUS) සේවාව අයත් වන්නේ,
    (1) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ය.
    (2) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ය.
    (3) නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ය.
    (4) නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ය.

22. ලුණු රහිත බටර් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම SCAMPER ආකෘතිය අනුව අයත් වන්නේ,
    (1) යළි සකස් කිරීම ය. (2) එකතු කිරීම ය.
    (3) සම්බන්ධ කිරීම ය. (4) ඉවත් කිරීම ය.

23. සාර්ථක ව්‍යාපාර අදහසක් වීමට නම්,
    (1) ජන මාධ්‍ය හරහා ප්‍රසිද්ධ වූවක් විය යුතුය.
    (2) අධ්‍යාපනික පාඨමාලාවක් තුළින් ලබාගත යුතුය.
    (3) පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින් ඇති විය යුතුය.
    (4) ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කළහැකි විය යුතුය.

24. දිනෙත්,දෙනුවන් තමන්ට ඇති විවේක අවස්ථාවලදී ඡායාරූපකරණය සිදු කරයි. මෙය ව්‍යාපාරයක් ලෙස දියුණු කිරීමට බලාපොරොත්තු වේ. මෙය අයත් වන ව්‍යාපාර මූලාශ්‍රය වනුයේ,
    (1) පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද ය.
    (2) නිර්මාණශීලී චින්තන හැකියාවන් ය.
    (3) විනෝදාංශ හා ලැදියාව ය.
    (4) ප්‍රදර්ශන හා අත්දැකීම් ය.

25. සබන් කුඩු වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේදී 50g, 100g, 200g, 500g හා 1kg ලෙස ඇසුරුම් ගණනාවකින් ඉදිරිපත් කිරීම අයත් වන්නේ,
    (1) නිෂ්පාදිත ප්‍රභේදනය භාවිතා කරමින් ඉදිරිපත් කිරීමක් ලෙස ය.
    (2) සුවිශේෂී නව භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීමක් ලෙස ය.
    (3) වෙළෙඳපොළ භිදැස හඳුනා ගැනීමක් ලෙස ය.
    (4) නවෝත්පාදනයක් ලෙස ය.

26. අමිල ඒකනායක මහතා නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටී. ඔහුගේ ව්‍යාපාරයේ සුවිශේෂිභාවය පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ,
    (1) වෙළෙඳපොළ විශ්ලේෂණය තුළ ය. (2) විධායක සාරාංශය තුළ ය.
    (3) සංවිධාන සටහන තුළ ය. (4) ආයෝජන ඇස්තමේන්තුව තුළ ය.

27. ව්‍යවසායකයෙකු තම අපේක්ෂිත ව්‍යාපාරය සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම වැදගත් වන්නේ,
    (1) ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට ය.
    (2) ණය ලබාගත් මූල්‍ය ආයතනයට ඉදිරිපත් කිරීමට ය.
    (3) නීතිමය අවශ්‍යතාවයක් හේතුවෙන් ය.
    (4) ව්‍යාපාරය තුළ ප්‍රදර්ශනය කළයුතු නිසා ය.

28. යෝජිත ව්‍යාපාරයක අලෙවි සැලැස්මෙහි අන්තර්ගත අයිතමය වන්නේ,
    (1) පරිපාලන වියදම් විශ්ලේෂණය යි.
    (2) ඉලක්ක වෙළෙඳපොළ විශ්ලේෂණය යි.
    (3) නිෂ්පාදන ක්‍රියාවලිය විශ්ලේෂණය යි.
    (4) මුදල් ප්‍රවාහය විශ්ලේෂණය යි.

29. ස්වාභාවික ශාකසාර ඇතුළත් සෞඛ්‍යයට හිතකර හිසකෙස් වර්ධනයට උපකාරී වන තෙල් වර්ගයක් මිහෙළි මහත්මිය නිපදවයි. මේ සඳහා වර්තමානයේ වඩාත් යෝග්‍ය අලෙවි ප්‍රවර්ධන උපක්‍රමයක් වන්නේ,
    (1) සමාජ මාධ්‍ය මඟින් ප්‍රචාරණය යි. (2) අත් පත්‍රිකා මඟින් ප්‍රචාරණය යි.
    (3) රූපවාහිනිය මඟින් ප්‍රචාරණය යි. (4) පෝස්ටර් මඟින් ප්‍රචාරණය යි.

30. "ප්‍රණීත රසකැවිලි" ව්‍යාපාරයේ දෛනික නිෂ්පාදන පිරිවැය තොරතුරු පහත පරිදි වේ.

	රු.
සීනි	1 500
හාල්පිටි	2 000
පොල්ගෙඩි	1 000
කුළුබඩු හා රසකාරක	600
සේවක වැටුප්	1 500

දෛනිකව නිෂ්පාදනය කරන රසකැවිලි ප්‍රමාණය ඒකක 100 ක් නම්, රසකැවිලි ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණද?

(1) රු. 55 (2) රු. 100
(3) රු. 66 (4) රු. 45

31. ව්‍යාපාරයක භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගන්නා යන්ත්‍ර ක්ෂය වියදමක් ලෙස සලකන වටිනාකම නිෂ්පාදන සැලැස්මෙහි ඇතුළත් කරනු ලබන්නේ,

(1) ද්‍රව්‍ය පිරිවැය තුළ ය. (2) ස්ථාවර වත්කම් පිරිවැය තුළ ය.
(3) නිෂ්පාදන වෙනත් වියදම් තුළ ය. (4) නිෂ්පාදන ස්ථාවර වත්කම් තුළ ය.

32. අපේක්ෂිත ව්‍යාපාරයක ඇස්තමේන්තුගත පරිපාලන වියදම් නිවැරදිව ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) දුරකථන වියදම්, සේවක වැටුප් හා චේතන, ලිපිද්‍රව්‍ය වියදම්, කාර්යාලීය උපකරණ ක්ෂය
(2) බෙදාහැරීමේ රථ ක්ෂය, ණය පොළී වියදම්, ලිපි ද්‍රව්‍ය වියදම්,දුරකථන වියදම්
(3) කම්හල් විදුලි වියදම්, දුරකථන වියදම්, කාර්යාලීය උපකරණ ක්ෂය, ණයපොළී වියදම්
(4) කාර්යාලීය උපකරණ ක්ෂය, බෙදාහැරීමේ රථ ක්ෂය, ණයපොළී වියදම්, ලිපි ද්‍රව්‍ය වියදම්

33. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් වන්නේ,

(1) රජයේ රෝහල් ය. (2) සුපිරි වෙළෙඳ සැල් ය.
(3) පෞද්ගලික බැංකු ය. (4) ඇඟලුම් නිෂ්පාදන ආයතන ය.

34. පෞද්ගලික හා රාජ්‍ය ලෙස ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි පදනම වනුයේ,

(1) අරමුණු අනුව වේ. (2) ලාභය අනුව වේ.
(3) වගකීම අනුව වේ. (4) හිමිකාරිත්වය අනුව වේ.

35. කේවල ස්වාමී ව්‍යාපාරයක ප්‍රධාන ලක්ෂණයක් වනුයේ,

(1) අයිතිකරුගේ වගකීම අසීමිතයි.
(2) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්යයි.
(3) නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිළිගැනීමයි.
(4) කළමනාකරුවන් මඟින් ව්‍යාපාර කටයුතු පාලනය කිරීමයි.

36. සමාගමේ පරමාර්ථ, කොටස් හිමියන්ගේ බැඳීම් කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ තොරතුරු ඇතුළත් ලියවිල්ල වනුයේ,

(1) සංස්ථාපන සහතිකයයි. (2) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයයි.
(3) සාංගමික ව්‍යවස්ථාවලියයි. (4) ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයයි.

37. වරලත්හිමියා විසින් තම වෙළෙඳ නාමය යටතේ විකිණීම වෙනුවෙන් වරලත් ලාභියාගෙන් ගාස්තුවක් අය කෙරේ. මෙය හඳුන්වන්නේ,

(1) කාරක ප්‍රාග්ධනය ලෙස ය. (2) ආයෝජිත ප්‍රාග්ධනය ලෙස ය.
(3) පුරස්කාරය ලෙස ය. (4) වරලත් ගාස්තු ලෙස ය.

38. ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිවීම සඳහා හිතකර සමාජයීය හා ආර්ථික සාධකයක් වන්නේ,

(1) වැටුප් ලබන රැකියාවකට ඇති ඉහළ පිළිගැනීම ය.
(2) යැපුම් මානසිකත්වයකින් යුක්ත වීම ය .
(3) හිතකර ආර්ථික පරිසරයක් පැවතීම ය.
(4) රජයේ දිරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම ය.

39. ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමේදී කාන්තාවන්ට මුහුණදීමට සිදුවන බාධාවක් වන්නේ,

(1) අවධානම් බාර ගැනීමට ඇති අකමැත්ත ය.
(2) ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතාවය ය.
(3) කාලය නිසි පරිදි කළමනාකරණය කිරීම ය.
(4) නිර්මාණශීලීත්වය ඉහළ මට්ටමක පැවතීම ය.

40. තනුජා සෑම විටම තම ව්‍යාපාරයේ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීමට අපේක්ෂා කරයි. ඇය මේ තුළින් ඉටු කරනු ලබන්නේ,

(1) නීතිමය වගකීමකි. (2) ආර්ථික වගකීමකි.
(3) සදාචාරාත්මක වගකීමකි. (4) පරාර්ථකාමී වගකීමකි.

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதர (சாதாரண தரம்) உதவித் மதிப்பீடு, 2026
Genaeral Certificate of Education (Ord. Level) Supportive Assesment, 2026

ව්‍යවසායකත්ව අධ්‍යයනය	I, II
முயற்சியாண்மை கற்கை	I, II
Entrepreneurship Studies	I. II

63 | **S** | **I,II**

ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචි **සසිඳු කෘෂිකාර්මික විෂය ධාරාවෙන්** උසස් පෙළ සමත්වූ දිරිමත් තරුණයෙකි. තම ප්‍රදේශයේ කෙසෙල්, දොඩම්, බෙලි, අඹ සහ පේර වැනි පලතුරු සුලභව පවතින නමුත් ප්‍රවාහන හා නිසි ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් විශාල අස්වැන්නක් නාස්ති වී යන බව ඔහු නිරීක්ෂණය කළේය. පලතුරු විජලනය කර කල් තබා ගැනීමේ නවීන තාක්ෂණික ක්‍රමවේද පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සති දෙකක ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් හැදෑරූ ඔහු **"සසිඳු ඩීහයිඩ්‍රේටස්"** නමින් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කළේය. තම පියාගෙන් හිමි වූ රු: 1 000 000 ක් වටිනා ඉඩම සහ ගොඩනැගිල්ල තම ව්‍යාපාරික ස්ථානය ලෙස යොදා ගැනීමට ඔහු තීරණය කළ අතර, ප්‍රදේශයේ සේවකයින් තිදෙනෙකු තමා යටතේ සේවයේ යෙදවීමටත් පරිසර හිතකාමී සූර්ය බලශක්ති වියලන (Solar Dehydrators) භාවිතා කිරීමටත් තීරණය කළේය. දේශීය වෙළෙඳපොළෙන් ඔබ්බට ගොස් තම නිෂ්පාදන මැදපෙරදිග රටවලට අපනයනය කිරීම ඔහුගේ ප්‍රධාන අනාගත ඉලක්කයයි. මෙම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා සසිඳු සතුව රු: 500 000 ක පෞද්ගලික ඉතුරුම් මුදලක් පැවති අතර, යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රජය මඟින් ක්‍රියාත්මක කරන සුළු ව්‍යවසායක දිරිගැන්වීමේ ණය යෝජනා ක්‍රමයක් යටතේ දේශීය වාණිජ බැංකුවකින් 12% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු: 300 000 ක ණයක් ලබා ගැනීමට සුදුසුකම් ලබා ගත්තේය.

(i) සසිඳුට මෙම ව්‍යාපාරික අදහස ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** ලියන්න.

(ii) සසිඳු තුළ පහත සඳහන් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ පවතින බව සිද්ධිය ඇසුරෙන් දක්වන්න.
(අ) පරිසර සංවේදීතාවය
(ආ) අනාගත දැක්ම

(iii) සසිඳු මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමේදී, බාහිර පරිසරයෙන් ඇතිවිය හැකි එක් **අවස්ථාවක්** සහ **තර්ජනයක්** සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

(iv) ව්‍යවසායකයෙකු විසින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු වැදගත් තීරණ **දෙකක්** සඳහන් කරන්න.

(v) සසිඳු නව නිෂ්පාදන දේශීය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේදී භාවිතා කළ හැකි ප්‍රවර්ධන ක්‍රම **දෙකක්** යෝජනා කරන්න.

ඔහුගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත තොරතුරු පහත පරිදි වේ: **රු.**

- සූර්ය බලශක්ති විජලන යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම 200 000
- ඇසුරුම්කරණ යන්ත්‍රයක් මිලදී ගැනීම 100 000
- ව්‍යාපාර සැලසුම සකස් කිරීම 6 000
- ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම 3 000
- අමුද්‍රව්‍ය මිලදී ගැනීම (මාසිකව) 75 000
- ප්‍රවර්ධන වියදම් (මාසිකව) 45 000

එක් අයෙකුට රු: 35 000 බැගින් මාසික වේතනයක් ගෙවීමට සේවකයින් තිදෙනෙකු සේවයට යොදවන ලදී. එසේම දෛනික කටයුතු පවත්වාගෙන යාම සඳහා රු: 40 000 ක මුදලක් අත තබා ගත යුතු වේ.

[හයවැනි පිටුව බලන්න.]

Past Papers Wiki

ගණනය කරන්න.

(vi) ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදම්.
(vii) ව්‍යාපාරය ආරම්භයේදී සසිඳු සතු වන මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම.
(viii) ව්‍යාපාරයේ මුළු ආයෝජනය.
(ix) ඇස්තමේන්තුගත මාසික මූල්‍ය වියදම.
(x) ව්‍යාපාරය ආරම්භ කරන පළමු මාසයේ සසිඳුගේ ව්‍යාපාරය වෙත ලැබෙන මුදල් ගලා ඒම්.

(ලකුණු 02 x 10 = 20)

2. (i) ව්‍යාපාරයක් යන්න නිර්වචනය කරන්න.
(ii) භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.
(iii) නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.
(iv) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර **දෙකක්** ලියන්න.
(v) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 2 x 5 = 10)

3. (i) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.
(ii) දේශීය ආර්ථික සංවර්ධනයේ දී කුඩා පරිමාණ ව්‍යාපාර දායකවන ආකාර **දෙකක්** සඳහන් කරන්න.
(iii) කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න.
(iv) අතීත ව්‍යාපාර පරිසරය හා නූතන ව්‍යාපාර පරිසරය අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.
(v) ශීඝ්‍ර වෙනස්වීම් සමඟ පුළුල් වන ව්‍යාපාර ක්ෂේත්‍රයේ දැකිය හැකි නව ප්‍රවණතා **දෙකක්** ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

4. (i) ඉලක්කගත පාරිභෝගිකයා යන්න හඳුන්වා දී ඊට නිදසුනක් සපයන්න.
(ii) පහත සඳහන් එක් එක් ව්‍යාපාර කටයුත්ත සඳහා වඩාත් සුදුසු ස්ථානය බැගින් ලියන්න.
(අ) රෙදි සාප්පුවක්
(ආ) පාසල් උපකරණ අලෙවි සැලක්
(iii) නව ව්‍යාපාරයක් සඳහා සාර්ථක පිවිසුම් උපාය මාර්ග **දෙකක්** ලියන්න.
(iv) ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.
(v) (අ) පේටන්ට් බලපත්‍රයේ වලංගු කාලය කොපමණද?
(ආ) නව සොයා ගැනීමකට අයත් වන දෑ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 x 5 = 10)

5. (i) ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කරන ආකාරය දක්වන්න.
(ii) රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ග **දෙකක්** නම් කරන්න.
(iii) හවුල් ගිවිසුමක ඇතුළත් කරුණු **දෙකක්** නම් කරන්න.
(iv) සීමාසහිත පුද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කළ යුතු ලියවිලි **දෙකක්** සඳහන් කරන්න.
(v) වරලත් ව්‍යාපාරයක වරලත් හිමියාට අත්පත් කරගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 x 5 = 10)

6. (i) ශ්‍රී ලංකාව වැනි රටකට ව්‍යවසායකත්ව සංස්කෘතියක අවශ්‍යතාවය ඉස්මතුවීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
(ii) ව්‍යවසායකත්වයට එරෙහි වන සමාජයීය සාධක **දෙකක්** සඳහන් කරන්න.
(iii) කාන්තාවන් ව්‍යවසායකත්වයට යොමුවීමට බලපාන හේතු **දෙකක්** දක්වන්න.
(iv) ව්‍යාපාර විසින් සමාජ වගකීම් පිළිපැදීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.
(v) ව්‍යවසායකයින්ට ලබාගත හැකි මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් **එක බැගින්** සඳහන් කරන්න.

(ලකුණු 02 x 5 = 10)

7. (i) ඇස්තමේන්තුගත මුළු ආදායම යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02)*
(ii) ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන ආකාරය දක්වන්න. *(ලකුණු 02)*
(iii) පහත දැක්වෙන්නේ "මනහර" ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මේ අඩංගු තොරතුරු වේ. ඒ ඇසුරින් එහි පළමු වර්ෂය සඳහා අපේක්ෂිත අවසන් ප්‍රතිඵලය ගණනය කරන්න.

අයිතමය	**වටිනාකම (රු.)**
මුදලට විකුණුම්	700 000
අමුද්‍රව්‍ය පිරිවැය	160 000
ශ්‍රම පිරිවැය	25 000
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	7 000
ණයට විකුණුම්	200 000
වෙනත් නිෂ්පාදන පිරිවැය	30 000
පරිපාලන වියදම්	8 500
මූල්‍ය වියදම්	2 500

(ලකුණු 06)
(මුළු ලකුණු 10)

***

ව්‍යවසායකත්ව අධ්‍යයනය

1 කොටස

පිළිතුරු පත්‍රය

1.	2	11.	3	21.	3	31.	3
2.	3	12.	3	22.	4	32.	1
3.	1	13.	4	23.	4	33.	1
4.	1	14.	4	24.	3	34.	4
5.	1	15.	2	25.	1	35.	1
6.	4	16.	2	26.	2	36.	3
7.	3	17.	2	27.	1	37.	3
8.	2	18.	2	28.	2	38.	3
9.	1	19.	3	29.	1	39.	2
10.	2	20.	2	30.	3	40.	2

ව්‍යවසායකත්ව අධ්‍යයනය

11 කොටස

පිළිතුරු පත්‍රය

1. (i)

- තම ප්‍රදේශයේ පළතුරු සුලභව පැවතීම.
- ප්‍රවාහන හා ගබඩා පහසුකම් නොමැතිකම නිසා පලතුරු විශාල වශයෙන් නාස්ති වීම දැකීම.
- පලතුරු වියලීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලැබීම.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(ii) (අ)

- ප්‍රදේශයේ පලතුරු බහුලතාවය හේතුවෙන් නාස්ති වන බව හඳුනාගැනීම.
- පරිසර හිතකාමී ලෙස "සූර්ය බලශක්ති වියලන යන්ත්‍ර" භාවිතා කිරීම.

(ලකුණු 01 යි.)

(ආ)

- දේශීය වෙළෙඳපොලෙන් ඔබ්බට ගොස් තම නිෂ්පාදන විදේශ රටවලට අපනයනය කිරීමට ඉලක්ක කිරීම.

(ලකුණු 01 යි.)

(iii) අවස්ථාව - රජය මඟින් ක්‍රියාත්මක කරන සුළු ව්‍යවසායක දිරිගැන්වීමේ ණය යෝජනා ක්‍රමයක් පැවතීම.

(ලකුණු 01 යි.)

තර්ජන - ස්වභාවික පරිසරයේ බලපෑම **(ලකුණු 01 යි.)**

(iv)

- ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය/සේවාව කුමක්ද යන්න තීරණය කිරීම.
- ව්‍යාපාරය පිහිටුවන ස්ථානය කුමක්ද යන්න තීරණය කිරීම.
- ව්‍යාපාරය සඳහා ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේද යන්න.
- ව්‍යාපාර සංවිධානය කුමක්ද යන්න.
- ව්‍යාපාරය සඳහා කොතරම් කැපවිය හැකිද?
- ඉලක්කගත පාරිභෝගිකයා කවුද?
- තරගයේ ස්වාභාවය කෙබඳුද?
- ඉපැයීම් ප්‍රමාණවත්ද?
- ව්‍යාපාරය පිහිටුවන ස්ථානය කෙබඳුද?
- ව්‍යාපාරය තුළින් සමාජයට කවර ප්‍රතිලාභ අත්කර දිය හැකිද?

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(v)

- ආකර්ශණීය ඇසුරුම්කරණය
- සුපිරි වෙලඳසැල් සහ ප්‍රාදේශීය ප්‍රදර්ශන කුටි හරහා නොමිලේ රසබැලීමේ අවස්ථාව ලබාදීම.
- සමාජ මාධ්‍ය වල කෙටි වීඩියෝ හරහා නිෂ්පාදනවල සෞඛ්‍යාරක්ෂිත බව ප්‍රචාරණය කිරීම.
- පෝස්ටර්, දැන්වීම් පුවරු
  (ගැලපෙන කරුණු 2 ක් සඳහා ලකුණු ලබාදෙන්න.)

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(vi) ව්‍යාපාර සැලසුම සකස් කිරීමේ වියදම 6 000
ව්‍යාපාර නාම ලියාපදිංචි ගාස්තුව 3 000
ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදම 9 000

(vii) සූර්ය වියලන යන්ත්‍ර දෙක සඳහා වියදම	200 000
විද්‍යුත් ඇසුරුම්කරණ යන්ත්‍රයේ මිල	100 000
ඉඩම සහ ගොඩනැඟිල්ල	1 000 000
මුළු ස්ථාවර වත්කම්	1 300 000

(viii) ස්ථාවර වත්කම් වටිනාකම	1 300 000
ආරම්භ කිරීමට පෙර වියදම	9 000
කාරක ප්‍රාග්ධනය	40 000
මුළු ආයෝජන	1 349 000

(ix) වාර්ෂික පොලිය $300\,000 \times \frac{12}{100} = 36\,000$ **(ලකුණු 01)**

මාසික පොලිය $\frac{36\,000}{12} = 3\,000$ **(ලකුණු 01)**

(x) පෞද්ගලික ඉතුරුම්	500 000
බැංකු ණය	300 000
මුළු මුදල් ගලා ඒම්	800 000

(ලකුණු 2×10 = 20)

2.

(i) ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා සම්බන්ධ වූ සියළුම කටයුතු ය.

(ii)

- භාණ්ඩ ස්පෘශ්‍ය වේ.එබැවින් භෞතික පැවැත්මක් ඇත.
  සේවා අස්පෘශ්‍ය වේ.එබැවින් භෞතික පැවැත්මක් නැත.
- භාණ්ඩ ගබඩා කළ හැකිය.
  සේවා ගබඩා කළ නොහැකිය .
- භාණ්ඩ වල සමජාතීය බව ආරක්ෂා කළ හැකිය.
  සේවා වල සමජාතීය බව ආරක්ෂා කළ නොහැකිය.
- භාණ්ඩ සඳහා පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යවශ්‍ය නොවේ.
  සේවා සඳහා බොහෝ විට පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසකි.
- භාණ්ඩ සපයන්නාගෙන් වෙන් කළ හැකිය.
  සේවා සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය.

(භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් වගුවක් ඇසුරෙන් ඉදිරිපත් කිරීමද නිවැරදි පිළිතුර ලෙස සලකා ලකුණු ලබාදෙන්න.)

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(iii)

- විවිධත්ව ග්‍රහණය කර ගැනීම.
- අසාර්ථකත්වය ඉවසීම
- කුතුහලය දිරිමත් කිරීම.
- ගැටලු අභියෝග ලෙස දැකීම
- නිර්මාණශීලී පුහුණු අවස්ථා
- නිර්මාණශීලිත්වය අගය කිරීම තුලින්
- නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය කිරීම.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(iv)

- අනපේක්ෂිත සිදුවීම්
- ක්‍රියාවලි අවශ්‍යතා
- වෙළඳපලේ වෙනස්වීම්
- ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ වන වෙනස්කම්
- සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස් වීම.
- දැනුම පදනම් කරගත් සංකල්ප **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

(v)

- ආර්ථික කටයුත්තක යෙදීම
- අවදානමකට මුහුණ දීම
- ගනුදෙනුවල නිරත වීම
- සම්පත් භාවිතා කිරීම
- නිෂ්පාදනය, මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ තීරණ ගැනීම
- තරගයට මුහුණ දීම
- පැවැත්ම ගැන සිතීම
- ස්වයං පෙළඹවීමක් තිබීම **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

3.

(i)

- ස්වකීය දෛවය තමා මත ම රඳා පැවතීම.
- කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම.
- සමාජයීය සුභ සාධනය සඳහා දායක විය හැකි වීම.
- ප්‍රයෝජනයට නොගත් හැකියා යොදා ගත හැකි වීම.
- ආකර්ෂණීය ලාභයක් ඉපයීම.
- ස්වයංපෝෂිත බව.
- වර්ධනය සඳහා පුද්ගලයන්ට ලැබෙන්නා වූ උපරිම අවකාශය
- නිදහස හා ඉතා ඉහළ තෘප්තියට පත් වීම. **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

(ii)

- රැකියාවල නිරත වූ පිරිස (සේවා නියුක්තිය) වැඩි වීම.
- ජාතික නිෂ්පාදනය වැඩි වීම.
- පුද්ගලයන් අතර ආදායම් බෙදී යාමේ විෂමතාව අඩු වීම.
- මහා පරිමාණ ව්‍යාපාර තුළින් නොසපයන භාණ්ඩ හා සේවා සැපයීම.
- කාලයාගේ ඇවෑමෙන් මහා පරිමාණ ව්‍යාපාර බවට පත්වීම.
- දේශීය දැනුම හා සම්පත් භාවිතයට ගැනීම. **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

(iii)

- ව්‍යාපාරයේ මුදල් කටයුතු පාලනය දුර්වල වීම.
- තරඟකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම.
- ව්‍යාපාරික කටයුතු සැලසුම්වලින් තොරව සිදු කිරීම.
- බොහෝ ව්‍යාපාරිකයන් ව්‍යවසායකයෙකු ලෙස නොසිතීම.
- ව්‍යාපාරයේ පවතින සම්පත් නිවැරදිව පාලනය නොකිරීම.
- ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් පවතින පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම.
- දුර්වල මානව සම්බන්ධතා. **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

(iv)

අතීත ව්‍යාපාර පරිසරය	නූතන ව්‍යාපාර පරිසරය
• එකල ජනතාව බොහෝ විට තම මූලික අවශ්‍යතා අවම මට්ටමකින් සපුරා ගත්හ. • අවශ්‍යතා හා උවමනා සරල විය. • තරඟකාරිත්වය අඩුය. • ව්‍යාපාරිකයෝ බලවත් වූහ. • ලාභය ප්‍රධාන අරමුණ විය. • කුඩා ප්‍රදේශයකට පමණක් සීමා වී තිබිණ. • වෙනස්වීමේ වේගය ඉතා අඩුය.	• ජනතාව තම මූලික අවශ්‍යතා ඉතා උසස් මට්ටමකින් සපුරා ගැනීමට උනන්දු වේ. • අවශ්‍යතා හා උවමනා සංකීර්ණ වී ඇත. • තරඟකාරිත්වය වැඩිය. • පාරිභෝගිකයෝ බලවත් වී ඇත. • ලාභ අරමුණ පමණක් නොව සමාජ වගකීම වැනි වෙනත් අරමුණු ද ඉටු කිරීම අපේක්ෂාව වේ. • ගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇත. • වෙනස්වීමේ වේගය ඉතා වැඩිය.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(කරුණු වශයෙන් ඉදිරිපත් කළද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න.)

(v)

- නව තාක්ෂණික ක්‍රම සහ උපකරණ භාවිතය.
- පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා නැඹුරුවක් ඇති වීම.
- නව බීජ වර්ග සහ ගෙවතු වගාව ප්‍රචලිත වීම.
- පාරිසරික සංචාරක කර්මාන්තය ව්‍යාප්ත වීම.
- රූපලාවන්‍ය, විලාසිතා හැඩගැන්වීම යනාදී ක්ෂේත්‍ර සඳහා ඉල්ලුම වැඩි වීම.
- සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය.
- ප්‍රවාහනය, මූල්‍ය සේවා හා සන්නිවේදන සේවාවන් සඳහා ඉල්ලුම වැඩි වීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වර්ධනය වීම.
- ස්වාභාවික පරිසරයට ඇති කැමැත්ත වැඩි වීම.
- සැකසූ ආහාර සඳහා ඉල්ලුම ඉහළ යාම.
- ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළින් ඇතිවන ව්‍යාපාර අවස්ථා
- ගෝලීයකරණය.
- පරිසර හිතකාමී බලශක්ති ජනනය.
- නැනෝ තාක්ෂණය තුළින් ඇතිවන ව්‍යාපාර අවස්ථා.
- කෘතිම බුද්ධිය භාවිතා කිරීම.
- මාර්ගස්ථ ක්‍රමයට කාර්යාල කටයුතු සිදු කිරීම.
- ගිණුම්කරණයේදී ගනුදෙනු වාර්තා කිරීම සඳහා පරිගණක මෘදුකාංග භාවිතය.
- රොබෝ තාක්ෂණය හරහා උපකාරක සේවා සැපයීම. **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

(ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.)

4.

(i) ව්‍යාපාරිකයා විසින් ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාව කිනම් පාරිභෝගික කණ්ඩායමක් සඳහාද යන්න ඉලක්කගත පාරිභෝගිකයා යන්නෙන් අදහස් වේ. **(ලකුණු 01)**

ළදරු පාවහන් - ළදරුවන්

(ගැළපෙන නිදසුනක් සඳහා ලකුණු 01 යි.)

(ii) (අ). රෙදි සාප්පුවක් **(ලකුණු 01)**

(ආ). පාසල් උපකරණ අලෙවිසැලක් **(ලකුණු 01)**

(iii)

- සුවිශේෂී නව භාණ්ඩයක් හෝ සේවාවක් වීම.
- නිෂ්පාදිත ප්‍රභේදනය

Past Papers Wiki

- වෙළෙඳපළ හිඩැස/ අවකාශය
- නවෝත්පාදනය **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

(iv)

ව්‍යාපාර අදහස	ව්‍යාපාර අවස්ථා
• ව්‍යාපාර අදහස් සුලභය.විවිධ මූලාශ්‍ර ඔස්සේ විශාල ප්‍රමාණයක් ව්‍යාපාර අදහස් ජනනය කරගත හැකිය. • ව්‍යාපාර අදහස් විවෘතය.බොහෝ අය ඒවා දකිති. • සෑම ව්‍යාපාර අදහසක්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකිය.	• ව්‍යාපාර අවස්ථා සුලභ නොවේ.ව්‍යාපාර අදහස් සිය ගණනකින් තෝරා ගත හැක්කේ ව්‍යාපාර අවස්ථා කිහිපයකි. • ව්‍යාපාර අදහස් අතුරින් ව්‍යාපාර අවස්ථා අනාවරණය කර ගැනීම සියල්ලටම කළ නොහැකිය. • ව්‍යාපාර අවස්ථා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකිය.

ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර වෙනස්කම් කරුණු ඇසුරින් ඉදිරිපත් කළද නිවැරදි පිළිතුර ලෙස සලකන්න.


(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(v) (අ) වසර 20 කි.

(ආ)

- නව නිමැවුමක්.
- නව ක්‍රියාවලියක්.
- නව යන්ත්‍රයක්.
- ඉහත කරුණුවල සංකලනයක්.
- පවත්නා සොයාගැනීමක වැඩි දියුණු කිරීමක්. **(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)**

5. (i)



(ii) රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සමාගම්

(iii)

- භවුල්කරුවන් ප්‍රාග්ධනය සපයන ආකාරය.
- භවුල්කරුවන්ගේ ලාභ පාඩු බෙදා ගන්නා ආකාරය.
- භවුල්කරුවන් ව්‍යාපාරයේ කටයුතුවලට දායක වන ආකාරය.
- භවුල්කරුවන්ගේ වැටුප් ලබාගැනීම.
- භවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම්.
- භවුල් ව්‍යාපාරයේ කටයුතු අවසන් කිරීම සම්බන්ධ තොරතුරු.
- ප්‍රාග්ධනයට අමතරව භවුල්කරුවන් සපයනු ලබන ණය සඳහා පොළී ගෙවීම.
- භවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෙනත් පොදු එකඟතා.

PAST PAPERS WIKI

Past Papers Wiki

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(iv)

- සමාගමේ නම පිළිබඳ ප්‍රකාශය
- සාංගමික ව්‍යවස්ථාවලිය
- සමාගමේ අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කිරීමට ඒ ඒ අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශය
- සමාගමේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට එම ලේකම්වරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශය.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(v)

- වරලත් නිමියාට ඔහුගේම ආයෝජනයකින් තොරව වෙනත් වෙළෙඳපොළවල් තුළ ව්‍යාපාර කටයුතු පුළුල් කර ගැනීමට අවස්ථාව උදාවීම.
- විශාල සේවක මණ්ඩලයක් පවත්වා ගැනීමෙන් දැරීමට සිදුවන පිඩන අවම කර ගනිමින් මහා පරිමාණ වාසි භුක්ති විඳීමට හැකිවීම.
- වරලත් නිමියාට ආදායමක් ලැබීම.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

6. (i)

- විරැකියාවට විසඳුමක් වීම.
- ආර්ථික වර්ධනයක් ලඟා කරගත යුතුවීම.
- භාවිතා නොවන සම්පත් සුලභව තිබීම .
- නව රැකියා නිර්මාණය කරන්නන් බිහිකර ගත යුතුවීම.
- ආදායම් බෙදීයාමේ විෂමතාව අවම කළයුතු වීම.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(ii)

- වැටුප් ලබන රැකියාවකට ඇති ඉහළ පිළිගැනීම.
- අවදානම් හා අභියෝග භාර ගැනීමට ඇති අකමැත්ත.
- අධ්‍යාපනය තුළින් දිරිමත් කිරීමක් සිදු නොවීම.
- රාජ්‍ය දිරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම.
- යැපුම් මානසිකත්වයෙන් යුක්ත වීම.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(iii)

- යහපත් ආර්ථික තත්ත්වයක් ලඟාකර ගැනීම සඳහා
- ජනඝනයෙන් බහුතරයක් කාන්තාවන් වීම.
- කාන්තාවන් අතර විරැකියාව බහුලව තිබීම.
- කාන්තා දායකත්වය අවශ්‍ය වන ව්‍යාපාර පැවතීම.
- කාන්තාවන් ඉහළ අධ්‍යාපනයක් ලබා ගැනීමේ ප්‍රවණතාව

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(iv)

- ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීම.
- ව්‍යාපාරයේ දිගු කාලීන පැවැත්ම ස්ථාපිත වීම.
- පැන නැගිය හැකි නීතිමය ප්‍රශ්න අවම වීම.
- ව්‍යාපාරයේ භාණ්ඩ හෝ සේවාවලට ඇති ඉල්ලුම ඉහළ යාම මඟින් ඉහළ ලාභදායකත්වයක් සහතික වීම.
- සේවකයන්ගේ චිත්ත ධෛර්ය ඉහළ සාම හා ව්‍යාපාරය කෙරෙහි ලැදියාව වර්ධනය වීම.

(ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි.)

(v) <u>මූල්‍ය දිරිගැන්වීම්</u>

- සහන පොළී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබාදීම.
- ඇප සුරැකුම් රහිත ණය ලබාදීම.
- ණය ආපසු ගෙවීම් කාලසීමාව වැඩි කිරීම.
- මූල්‍යමය ප්‍රදාන.

මූල්‍ය නොවන දිරිගැන්වීම්

- ව්‍යවසායකත්ව පුහුණුව.
- සේවකයන් පුහුණුව.
- අලෙවිකරණ පුහුණුව.
- ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට උපදේශනය.
- තාක්ෂණික පුහුණුව ලබාදීම.
- ඇසුරුම්කරණය පිළිබඳ දැනුම ලබාදීම.
- වෙළෙඳපොළ සොයාදීම.

(එක් මූල්‍ය දිරිගැන්වීමක් සහ මූල්‍ය නොවන දිරිගැන්වීමක් සඳහා ලකුණු 01 බැගින් ලකුණු 02 යි.)

7. (i) යම් කාලඡේදයක් තුළ ඉපයීමට අපේක්ෂිත විකුණුම් ආදායම සහ අනෙකුත් අපේක්ෂිත ආදායම්වල එකතුව ඇස්තමේන්තුගත විකුණුම් ආදායම වේ.

(ii) ඒකකයක නිෂ්පාදන පිරිවැය = $\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව}}$

(iii)

මනහර ව්‍යාපාරය
පළමු වර්ෂය සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ
ලේඛනය

	රු.		රු.	
විකුණුම් ආදායම - මුදලට	700 000	½		
- ණයට	200 000	½	900 000	½
(-) මුළු නිෂ්පාදන පිරිවැය				
අමුද්‍රව්‍ය පිරිවැය	160 000	½		
ශ්‍රම පිරිවැය	25 000	½		
වෙනත් නිෂ්පාදන පිරිවැය	30 000	½	(215 000)	½
(-) මුළු නිෂ්පාදන නොවන පිරිවැය				
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	7 000	½		
පරිපාලන වියදම්	8 500	½		
මූල්‍ය වියදම්	2 500	½	(18 000)	½
ශුද්ධ ලාභය			667 000	½

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library